**සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---------------------------------------------------------------------------

සවුදි අරමුදලින් මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල අතර 2012 ඔක්තෝබර් 30 දින එළඹි අංක 9/574 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර හා වයඹ පළාත්වල මාර්ග 09 ක කිලෝමීටර 138.39 ක කොටස් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 10,628 කට සමාන එජඩො මිලියන 81.75 ක් වූ අතර ඉන් රු.මිලියන 7,800 කට සමාන එජඩො මිලියන 60 ක් සැපයීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-------------------------------------------

2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
----------------------------------------------------

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛය අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් බඳවාගන්නා ලද උපදේශකවරයාට පාරිශ්‍රමික හා ප්‍රවාහන දීමනා ලෙස පිළිවෙලින් රු. 50,646 ක් හා රු. 92,000 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
-------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
----------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014 දෙසැම්බර් 31 දිනට** | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| සවුදි සංවර්ධන අරමුදල - ප්‍රධාන නියෝජිතායතනය | 60.00 | 7,800 | 1607.8 | 12.35 | 1,606.4 | 15.33 | 1,993.1 |
| ශ්‍රී ලං ර | 21.75 | 2,828 | 79.9 | 0.61 | 79.8 | 0.92 | 120.3 |
| එකතුව | 81.75 | 10,628 | 1,687.7 | 12.96 | 1,686.2 | 16.25 | 2,113.4 |

3.2 භෞතික ප්‍රගතිය
---------------------

ලැබුණු තොරතුරු අනුව, දෙහිඕවිට - දැරණියගල - නූරි මාර්ගයේ දෙහිඕවිට සිට දැරණියගල දක්වා මාර්ග කොටසේ පුනරුත්ථාපන වැඩ සඳහා 2014 දෙසැම්බර් 31 දිනට සියයට 75.49 ක ප්‍රගතියක් ඉටුකර ගැනීමට අපේක්ෂා කර තිබුණද සියයට 43.57 ක අඩු ප්‍රගතියක් දක්වා තිබුණි. තවද මහනුවර - යාපනය මාර්ගයේ පලාපත්වල සිට නාවුල දක්වා කොටස පුනරුත්ථාපනය කිරීමේ වැඩ සඳහා 2014 දෙසැම්බර් 31 දිනට සියයට 85.83 ක ප්‍රගතියක් ඉටුකර ගැනීමට අපේක්ෂා කර තිබුණද, එදිනට සියයට 22.37 ක ඉතා අඩු ප්‍රගතියක් දක්වා තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් එම ප්‍රමාදයන් සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණු ඉතිරි වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත වැඩ සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
------------------------------

දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් වැඩ පිළිබඳ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත්තුවේ විශේෂිත පිරිවිතර, වෙළුම 11 හි 103.4 උප වගන්තිය අනුව, සියලුම සලකුණු, ලාම්පු, බාධක, ප්‍රවාහන පාලන සංඥා, මාර්ග සලකුණු කිරීම් ආදිය සැපයීම මඟින් ප්‍රවාහන හා තුන්වන පාර්ශවයන් සඳහා ආරක්ෂාව සඳහා කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. කෙසේ වුවද සපයා තිබූ ආරක්ෂක පෙර සූදානම් සහ ප්‍රවාහන පාලන ක්‍රියාමාර්ග අසතුටුදායකව පැවති බව භෞතික විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. මාර්ග සංවර්ධන අධිකාරියේ උපදෙස්වලට අනුකූල නොවීම හා කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රවාහන කළමනාකරණ සැලැස්ම පිළිබඳ නේවාසික ඉංජිනේරු විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) දැරණියගල දිස්ත්‍රික් රෝහලට ප්‍රවේශ මාර්ග, දැරණියගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, හා දැරණියගල පොලිස් ස්ථානය වැඩිදියුණු කිරීමද ව්‍යාපෘතිය යටතේ සිදුකර තිබූ නමුත් ඒවා මෙම ව්‍යාපෘතියේ විෂය පථයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ආරම්භක අදියරයන්හිදී ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම විධිමත් ලෙස සිදු කර නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 154.69 ක් වූ පිරිවැය ඉක්මවීම හා රු.මිලියන 75.17 ක් වටිනා විචලන නියෝගයන් 2014 දෙසැම්බර් 31 දක්වා අනුමත කර තිබූ බව නිරීක්ෂණය විය.

3.4 මතභේදයට තුඩුදෙන කරුණු
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ මහාමාර්ග සැලසුම් අංශයේ කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා ගෙවීමට සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.6 ක මුදලක් ව්‍යාපෘතිය විසින්

වැය කර තිබුණි. කෙසේ වුවද ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2015 ජුලි මාසයේදී විගණකවරුන් සිදුකරන ලද භෞතික පරීක්ෂණයන්ට අනුව, කටුගස්තොට - අලවතුගොඩ මාර්ගයේ හා අලවතුගොඩ - පලාපත්වල මාර්ගයේ ස්ථාන 08 ක් නායයෑම් හේතුවෙන් ගැලවී ගොස් තිබුණි.

3.5 ඵලරහිත ගනුදෙනු

----------------------

අලවතුගොඩ සිට පලාපත්වල දක්වා මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ යෙදී සිටි කොන්ත්‍රාත්කරුට අතුරු ගෙවීම් සහතික 03 කින් ගෙවීම් කර තිබූ රු.262,904,343 ක් දින 01 සිට දින 23 දක්වා ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු. 987,008ක් වූ මූල්‍ය ගාස්තු අතිරේකව ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය.